# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2494/13 – 2026 ජුනි මස 24 වැනි බදාදා – 2026.06.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2026 අංක 43 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 03/J/85E/272.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* ඉ. අ 3582.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2026 මැයි මස 25 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, මාතර.

II. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 425 - මැද්දවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැල්ලමඩම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු.පි මාර 1410 හා 1990.06.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අංක 01 – පහළ මහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0. 4300**

උතුරට: ඉහළ මහ කුඹුර; නැගෙනහිරට: ඉහළ මහ කුඹුර, ඇළ සහ සරසවි බිම; දකුණට: මාර 977 වැනි මූලික පිඹුරේ 2 වැනි කැබැල්ල; බටහිරට: සරසවි බිම සහ ඇළ.

EOG 06 - 0278

1A – G 047103 – 13 (2026/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2026 අංක 48 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 4-3/15/2025/SW/86.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* DS/GFG/L&L/05/152.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2026 ජුනි මස 15 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, කඩවත් සතර, ගාල්ල.

II. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 98D, දංගෙදර බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දංගෙදර ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/GFG/2025/744 හා 2026.01.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන කැබලි අක්ෂර A වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2920ක් පමණ වන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

**01.** කැබලි අක්ෂර **A – අඹගහවත්ත, කිල්ලොටවත්ත ගොඩවත්ත සහ ඕවිට – ප්‍රමාණය: හෙක්. 0.2920**

උතුරට: ක.සි. 810038 කලාප 3 පත්‍ර 1හි කැබලි අංක166, 167, 175, 174 සහ 184; නැගෙනහිරට: ක. සි. 810038 කලාප 3 පත්‍ර 1හි කැබලි අංක 175, 174, 184 සහ 183; දකුණට: ක.සි. 810038 කලාප 3 පත්‍ර 1හි කැබලි අංක 183, 182, 181 සහ 144; බටහිරට: ක.සි. 810038 කලාප 3 පත්‍ර 1හි කැබලි අංක 144, 166, 167 සහ 175.

EOG 06 - 0279

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.